විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

ஓய்வூதியத் திணைக்களம்
DEPARTMENT OF PENSIONS

ශ්‍රී ලංකා විශ්‍රාම
இலங்கை ஓய்வு
Sri Lanka Pensions

පරපුරක අභිමානය    தலைமுறையொன்றின் பெருமிதம்    Pride of a Generation


මගේ අංකය
எனது இல.
My No. ..විවැ/සං01/ඒ.සේ.වා.ස්.මා/2024

ඔබේ අංකය
உமது இல.
Your No. ..........................

දිනය
திகதி
Date 2023.08.29

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්/ ප්‍රාදේශීය ලේකම්වරුන්;
ප්‍රධාන කාර්යාලයේ සියලුම අංශ භාර මාණ්ඩලික නිලධාරීන් මගින්

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට අනුයුක්ත සියලුම නිලධාරීන් වෙත

<u>ඒකාබද්ධ සේවා නිලධරයින්ගේ වාර්ෂික ස්ථාන මාරු - 2024</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක COM/Trans/V/වා.මා.ස්/2024 හා 2023.08.25 දිනැති ලිපිය හා ඒකාබද්ධ සේවා චක්‍රලේඛ අංක 01/2023 හා බැඳේ.

02. ඒ අනුව ඒකාබද්ධ සේවාවන්හි නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු සඳහා ඉල්ලුම් කිරීමට අපේක්ෂා කරන මෙම දෙපාර්තමේන්තුවේ ඒකාබද්ධ සේවාවන්හි නිලධාරීන් යථෝක්ත ලිපියෙහි සඳහන් උපදෙස් පරිදි මාර්ගගත ක්‍රමය ඔස්සේ MISCO මෘදුකාංගයේ දත්ත යාවත්කාලීන කිරීමෙන් පසු ස්ථාන මාරු අයදුම් කර, එහි මුද්‍රිත පිටපත් දෙකක් දිස්ත්‍රික් ලේකම් / ප්‍රාදේශීය ලේකම් / අංශ භාර මාණ්ඩලික නිලධාරී (ප්‍රධාන කාර්යාලය) **නිර්දේශ සහිතව** දෙපාර්තමේන්තුවේ පාලන අංශය වෙත යොමු කළ යුතු බව මෙයින් කාරුණිකව දන්වා සිටිමි.

03. සෑම විටම නිවැරදි තොරතුරු ඇතුලත් කිරීමට නිලධාරියා පෞද්ගලිකවම වගබලා ගත යුතු අතර, ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත අනුයුක්ත කළමනාකරණ සේවා නිලධාරීන් තම සේවා ස්ථානය ප්‍රධාන කාර්යාලය වන බවට සලකා තොරතුරු ඇතුලත් කල යුතුය. නිර්දේශ සහිත අයදුම්පතෙහි පිටපතක් තමා සතුව තබාගැනීමට සෑම නිලධාරියෙක්ම කටයුතු කල යුතුය.

04. අයදුම්පත් තැපැල් මගින් එවන නිලධාරීන් ලිපි කවරයේ ඉහල වම් කෙලවරේ "ඒකාබද්ධ සේවයේ වාර්ෂික ස්ථානමාරු - 2024" ලෙස සඳහන් කර අධ්‍යක්ෂ (පාලන), විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව, මාළිගාවත්ත, කොළඹ 10. යන ලිපිනයට යොමු කරන මෙන් වැඩිදුරටත් දන්වමි.

05. සියලුම නිර්දේශිත අයදුම්පත් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත 2023.09.08 දිනට පෙර **මාර්ගගතව යොමු කිරීමට හැකිවන පරිදි, <u>2023.09.05</u> වන දින ප.ව 4.00 ට පෙර පාලන අංශය වෙත ලැබෙන සේ** යොමු කල යුතු අතර පමාවී ලැබෙන අයදුම්පත් සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු නොකරන බව ද කාරුණිකව දන්වමි.

06. උක්ත ලිපියේ හා ස්ථානමාරු චක්‍රලේඛයේ දක්වා ඇති විධිවිධාන තරයේ අනුගමනය කරන මෙන් ද වැඩි දුරටත් අවධාරණය කරමි.

ඒ. ජගත් ඩී. ඩයස්
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්


මාළිගාවත්ත, කොළඹ 10. மாளிகாவத்தை கொழும்பு 10. Maligawatta, Colombo 10.
Hot line: 1970, Direct line: 2209800, Fax: 2342078, Email: info@pensions.gov.lk, Web: www.pensions.gov.lk